# යටත් විජිත සමයේ සංඝ සංවිධානය පිළිබඳ විග්‍රහයක්.

කථිකාචාර්ය අජිත් තල්වත්ත

ඈත අතීතයේ සිට ම සංඝ සමාජය සහ සිංහල ජන සමාජය අතර සමීප සබඳතාවන් පැවතිණ. ක්‍රි. පූ. 3 වැනි ශතවර්ෂයේ දී සිදු වූ මහින්දාගමනයත් සමග රටේ මුල් බැසගත් බුදු දහමත් සංඝ සසුනත් සමාජය තුළ අතිමහත් පරිවර්තනයක් ඇති කිරීමට සමත් විය. එතෙක් මේ රටේ ප්‍රචලිත ව පැවති විවිධ ආගමික ඇදහිලි පමණක් නොව ජන ජීවිතය ද අභිබවා නව සංස්කෘතියක් උදා වූයේ එහි ප්‍රතිඵලයක් ලෙසිනි. සිංහල සමාජ සංවිධානය, භික්ෂු ශාසනය හා රාජ්‍යත්වය යන ත්‍රිවිධ අංශය ම මනා ව සම්බන්ධ වී එකිනෙකින් වෙන් කළ නොහැකි සේ බැඳෙමින් අන්‍යෝන්‍ය වශයෙන් ආරක්ෂා වී වර්ධනය වූයේ ය.

රාජ්‍ය පාලකයා ප්‍රමුඛ ප්‍රභූන් බුදුදහම වැළඳ ගත් අතර ඔවුන්ගෙන් ලැබුණු අනුග්‍රහයත් නිසා රට පුරා බුදුදහම ව්‍යාප්ත විය. ඒ තුළින් ඉදි වූ බෞද්ධ විහාරාමත්, ඒවායේ වැඩ විසූ භික්ෂූන් වහන්සේලාගේ ශාසනික මෙහෙවරත් නිසා සිංහලයාගේ ජීවන රටාවෙන් වෙන් කළ නොහැකි අන්දමින් ස්ථාපිත විය. දළදාව, ශ්‍රී මහා බෝධිය, පාත්‍රා ධාතුව මෙන් ම සිංහල ජන සමාජය හා සමීප ව පැවතුණි. දිගින් දිගට ම ලැබුණු රාජකීය අනුග්‍රහය යටතේ ශතවර්ෂ ගණනාවක් තිස්සේ පෝෂිත වූ  බුදු සසුන ලංකා සංස්කෘතියෙහි අණසක පතුරවන්නට විය.

බුද්ධාගම සිංහල දේශයේත් සිංහල ජාතියේත් උරුමය ලෙසත්, ජාතික ආගම ලෙසිනුත් ස්ථිර විය. බුදුදහම ස්ථාපිත වූ අවධියේ සිට ම සිංහල රාජ්‍යයේ අවසානය වූ 19 වැනි ශතවර්ෂය දක්වා මේ අති දීර්ඝ කාලය තුළ සිංහාසනයේ නිත්‍යානුකූල අයිතිය බෞද්ධයකු මිස වෙන කිසිවකුටත් හිමි නොවන බව සිංහලයන්ගේ පිළිගැනීම විය. ලක්දිව

රාජාසනය හිමි වීමට මහා සංඝයාගේ ද අනුමැතිය අවශ්‍ය විය. මෙය වඩාත් පැහැදිලි වන්නේ 9 වන ශතවර්ෂයේ දී ඔටුනු පැළඳීම ආගමික කෘත්‍යයක් හැටියට සංඝයා ඉදිරියෙහි සිදු කරන ලද බැව් මහාවංසයෙහි සඳහන් වී ඇති බැවිනි.[1] ඉන්දියාවෙන් ලක්දිවට ලැබුණු ශ්‍රී මහා බෝධි ශාඛාව, පාත්‍රා ධාතුව, දන්ත ධාතුව, කේස ධාතුව, ආදි සියලු ආගමික වස්තූන් ද සිංහලයන්ට අයිති ජාතික වස්තූන් සේ ආරක්ෂා කළෝ ය. ආගමත්, ජාතියත් හා රාජ්‍යයත් එක් වීම නිසා රටේ පාලන කටයුතුවල දී ජාතියේ නිදහසට හා ආරක්ෂාවට ද භික්ෂූන් වහන්සේලා සහභාගි වූහ.[2] රොබට් පර්සිවල් තම කෘතියේ භික්ෂූන් වහන්සේලාගේ වැදගත්කම පෙන්වීමේ දී ජන සමාජයේ උත්තරීතර තැනැත්තා වූයේ භික්ෂුව ලෙසත් මහජන මතය ගොඩනැගී තිබුණේ ද උන්වහන්සේ කේන්ද්‍ර කරගෙන බවත් පවසයි.[3] මේ අනුව භික්ෂුව පාලන තන්ත්‍රය තුළ කුමන කාර්ය භාරයක් ඉටු කරනු ලැබුවේ දැයි අවබෝධ වේ. රාජ්‍ය කටයුතුවල දී පමණක් නොව සමාජ ම ය ජීවිතයේ දී ගිහියන්ගේ සෑම අවශ්‍යතාවකදී ම උන්වහන්සේලාගේ දායකත්වය ඉතා වැදගත් විය. සිහසුන සඳහා භික්ෂුව සතු ව පැවති අධිකාරී බලයත් ඉන් මනා ව ගම්‍ය වේ. මේ ආකාරයට අනුරාධපුර අවධියේ සිට මහනුවර යුගය දක්වා භික්ෂූන් වහන්සේ ජන සමාජයෙහි ඉතා වැදගත් ප්‍රශංසනීය කර්ය භාරයක් ඉටු කළහ.

ක්‍රි. ව. 1505 දී පෘතුග්‍රීසි ආගමනයත් සමග භික්ෂුව, රාජාණ්ඩුව, සහ සිංහලයා අතර පැවති සබඳතාව ක්‍රමයෙන් දෙදරා යන ලකුණු පහළ විය. බොහෝ දුරට රට අභ්‍යන්තරයේ දේශපාලන ස්ථාවර භාවයක් නොවුණු බැවින් කෝට්ටේ රජු ලංකාවේ අග රජු හැටියට සම්මත වූ නමුත්, ප්‍රාදේශික රජුන් හා අගරජු තුළ ස්ථාවර සම්බන්ධතාවක් හෝ සමගියක් නොපැවැත්තේ ය.[4] මේ රජුන් අතර කෝලාහල ඇති විය. රටේ දියුණුවට අවශ්‍ය දේ කිරීමට රජුන්ට ශක්තියක් හෝ අවකාශයක් නැති විය. ආර්ථික තත්ත්වය ද ක්‍රමයෙන් පිරිහෙමින් පැවතිණ. මෙසේ රටේ වර්ධනය වූ පසුගාමී තත්ත්වය නිසා ශාස්ත්‍රීය කටයුතු අතින් අභිවෘද්ධියක් ඇති නොවී ය. දිවයින දේශපාලන ආර්ථික හා ශාස්ත්‍රීය පරිහානියත් සමග බුද්ධාගමේ හා භික්ෂූන් වහන්සේලාගේ ද තත්ත්වය දුර්වල විය.

රටේ පැවති අස්ථාවර තත්ත්වයත් පාලකයන්ගේ දුර්වලකම් නිසා පෘතුගීසින්ට රට අභ්‍යන්තර පරිපාලන කටයුතුවලට අත පොවන්නට අවස්ථාව උදාවීම නිසා දිනෙන් දින ම බුදු සසුන හුදකලා වන්නට විය.

පෘතුගීසීන්ගේ එක් අරමුණක් වූයේ ක්‍රිස්තියානි ආගම මෙරට ව්‍යාප්ත කිරීම යි. කොළඹ, පානදුර, මග්ගොන, බේරුවල, ගාල්ල, වැලිගම, ආදී මුහුදුබඩ පළාත්වල පෘතුග්‍රීසින් සමග පැමිණි රෝමානු කතෝලිකයන්ගේ බලය පැතිරෙන්නට විය. ආගම ව්‍යාප්ත කිමරී තම දෙවියන් වහන්සේ වෙනුවෙන් යුතුකම ඉටු කිරීමක් සේ ඔවුහු සිතූ හ. ස්වකීය ආගම ව්‍යාප්ත කරන ගමන් දේශීය ආගම විනාශ කිරීමේ ව්‍යාපාරයක් ද ගෙනගිය පෘතුග්‍රීසීහු බෞද්ධ වෙහෙර විහාර වනසමින් භික්ෂූන් වහන්සේලාට තාඩන පීඩන කරමින් මහත් භීෂණයක් නිර්මාණය කළෝ ය.[5] හත්වැනි බුවනෙකබාහු (1521-1551) රජතුමාට ක්‍රිස්තියානි පූජකවරුන්ගෙන් සිදු වූ බලපෑම නිසා කෝට්ටේ රාජ්‍යයට ක්‍රිස්තියානි පූජකයන්ට ප්‍රියමනාප වූ උරුමක්කාරයකු බලයට පත් කරවීමට ඔවුහු උත්සාහ ගත්හ. පසුව ධර්මපාල බෞතීස්ම කිරීමට ද පූජකවරු නොබෝ කලකින් සමත් වූහ. මේ අනුව අභිෂේකය ලද රජතුමා බුද්ධාගමේ ආරක්ෂකයා සහ ප්‍රධාන අනුග්‍රාහකයා යන තත්ත්වයෙන් ඉවත් වී කතෝලික ආගම පෝෂණය කර අවසානයේ කෝට්ටේ රජකම පවා කතෝලික, පෘතුගීසි රජුට තෑගි ඔප්පුවකින් පැවරීමට ද කැමැත්ත පළ කර තිබේ. ධර්මපාල රජු බෞතීස්ම වීමත් සමග සිදු වූයේ එතෙක් බෞද්ධ විහාරාරාම සතු වූ ඉඩකඩම් හා ධන ධාන්‍ය ය ආදිය ක්‍රිස්තු ධර්මයේ ව්‍යාප්තිය සඳහා පූජකවරුන් වෙත පැවරීම ය. ඒ සමග ම මෙතෙක් සිංහල ජනතාවගේ නොමඳ ගෞරවාදරයට පත් වූ දළදා මැඳුර සාන්ත ෆ්‍රැන්සිස් ක්ෂේවියර් මුනිතුමාගේ පල්ලිය බවට පරිවර්තනය විය.[6] සුවිසල් විහාරාරාම, බුදු පිළිම, කඩා බිඳ දමා කතෝලික පල්ලි බවට පූජකයන් විසින් පරිවර්තනය කරන ලදි. කැලණිය වැනි අතිශයින් පූජනීය ස්ථාන විනාශ කොට දමා ඒවා සතු දේපොළ ෆ්‍රැන්සිස්කානු පූජකයන්ට පැවරී ය.[7] ඒ වගේ ම වත්තල සිරිසඟබෝ පිරිවෙන, සුනේත්‍රා දේවි පිරිවෙන, තොටගමුවේ විජයබා පිරිවෙන ඇතුළු මහා පිරිවෙන් විනාශ කොට ඒවායේ පුස්තකාල ගිණිබත් කළහ. විහාරාරාමවල තිබූ වස්තුව කොල්ල කෑමේ යෙදුණු පෘතුග්‍රීසි සොල්දාදුවෝ කතෝලික පූජකයන්ගේ ඉගැන්වීම නිසා වෙරළබඩ පිහිටා තිබූ විහාර දේපොළ කොල්ල කෑහ. කැළණිය රජමහා විහාරය, මුල්කිරිගල, තනගල, ගෝකණ්නාගිරි විහාරය, ආදී ඒවා විනාශයට පත්වූ ඒවා අතර විය.[8]

මේ ආකාරයට බුදුදහමට එරෙහිව නොයෙක් කෙනෙහිලිකම් සිදු වෙද්දී අසරණ වූ භික්ෂූන් වහන්සේලාට සීතාවක රාජධානිය තුළ ආරක්ෂාව සැපයිණි. මායාදුන්නේ යටතේ බුදුදහමට රැකවරණය ලැබුණ ද බුදුදහම හැරදමා හින්දු ආගම වැළඳගත් පීතෘඝාතක පළමුවැනි රාජසිංහ

රජුගේ කාලයේ දී ඇති වූ භයානක යුධ කෝලාහලත් නිසා, රජුගේ දරුණු සාහසික ක්‍රියා නිසා බුද්ධාගමටත් භික්ෂූන් වහන්සේලාටත් බරපතල හානි සිදු විය.[9] මහාවංසයෙහි ද රාජසිංහ රජතුමා බෞද්ධ විරෝධී ක්‍රියා කළ බවට පෙන්වා දී ඇත.[10] රාජසිංහ රජුට එරෙහි ව කුමන්ත්‍රණය කළ භික්ෂූන් වහන්සේලා චෝදනා විභාගයෙන් වැරදිකරුවන් වූ විට සීතාවක ගඟේ කතාමැදිරියන් වලේ ගිල්වා මරා ඒ භික්ෂූන් වහන්සේලා සතු පන්සල් හා දේපොළ ආදිය අරිට්ට කීවෙණ්ඩු පෙරුමාල් ප්‍රමුඛ ඉන්දියානු තන්ත්‍රයානික බ්‍රාහ්මණ පූජකයන්ට පවරා දී ඇත. මෙසේ රජු බොහෝ භික්ෂූන් මරවා ආගමික වූ ද ශාස්ත්‍රීය වූ ද, පොත් පත් මහත් රාශියක් විනාශ කළ බව පෙනේ. කෝට්ටේ ප්‍රදේශයේ බෞද්ධ කටයුතු අඩාල වීමත් භික්ෂූන් වහන්සේලා විශාල පිරිසක් උපැවිදි වීමත් නිසා සංඝ ශාසනය තුළ උපසම්පදා කර්මය නොපැවැත්වීමට හේතු විය.

සීතාවක රාජසිංහ මියයෑමත් සමග සීතාවක රාජ්‍යයේ ඇති වූ බල අරගලය ප්‍රයෝජනයට ගත් ප්‍රතිකාලුන් ධර්මපාලගේ නාමයෙන් ඒවා නැවත කෝට්ටේ රාජ්‍යයට ඈඳා ගැනීමට ක්‍රියා කළහ. මේ නිසා බෞද්ධයන්ට පහතරට ප්‍රදේශවල ආරක්ෂාවක් නොවී ය. මෙම අවධිය වන විට මහනුවර රාජධානියේ වැදගත්කම ඉස්මතු වූ අතර පළමුවැනි විමලධර්මසූරිය බලයට පත් වීමත් සමග සිංහල ජාතියේත් බෞද්ධාගමේත් ආරක්ෂකයා විය. මින් පසු සීතාවකින් අවතැන් වූ භික්ෂූන් වහන්සේලා කන්ද උඩරට රාජධානියේ බල ප්‍රදේශ තුළ ඒකරාශි වූහ.

රාජාණ්ඩුව, සිංහල ජන සමාජය හා සංඝයා වහන්සේලා අතර පැවති සම්බන්ධතාව මෙසේ පසුබෑමකට ලක් වුව ද, උඩරට රාජ්‍යය ප්‍රමුඛ වීමත් සමග යළි ගොඩනැගෙන්නට විය. ප්‍රතිකාලුන් විසින් පහරතට ප්‍රදේශයේ විනාශ කරන ලද බෞද්ධ ආයතන යළි ගොඩනගන්නට විය. එමගින් ජනතාව ඔහු වටා තව තවත් එක්රොක් විය. මෙලෙස ආගම ඉතා වැදගත් කොට සැලකූ විමලධර්මසූරිය රජතුමා පුරාණයේ සිට ලංකා රාජ්‍ය උරුමයේ සංකේතය වශයෙන් පිළිගැනුණු දළදා වහන්සේ දෙල්ගම විහාරයෙන් සෙන්කඩගල පුරයට වැඩම කොට රජ මාළිගය ආසන්නයේ මාළිගාවක් ඉදි කොට දළදා වහන්සේ එහි වඩා හිඳුවා පුද පූජා පැවැත්වී ය. බදුල්ල, දෙවනගල ආදී විහාරාරාමවලට ගම්වර පූජා කර රාජානුග්‍රහය ලබා දී තිබේ. එනමුත් බුද්ධාගම සම්බන්ධයෙන් සලකා බලන විට විමලධර්මසූරිය රාජ්‍ය කාලය තුළ ලංකාවේ භික්ෂු ශාසනයේ ප්‍රබල පරිහානියක් පැවති බව පෙනේ.[11] පහතරට ප්‍රතිකාලුන් ස්ථාවර වීමත් සමග භික්ෂූන් වහන්සේලාට සිවුරු දරා ආගමික කටයුතුවල නිරත

වීම තහනම් කෙරිණි. ප්‍රැන්සිස්කන් පූජකවරු ප්‍රතිකාල් හමුදා ආධාරයෙන් බෞද්ධ ආරාම විනාශ කළා පමණක් නොව, භික්ෂූන් වහන්සේලා ද ඝාතනය කළහ. මේ නිසා වත් පිළිවෙත් රැකීමට භික්ෂූන්ට නොහැකි විය. සුදු පිළි හැඳගත් මෙම කාලයේ සිටි පිරිස දස සිල් සුරකිමින් ජීවත් විය. ඔවුහු ගණින්නාන්සේ ලෙස හඳුන්වනු ලැබූහ.[12] මෙසේ භික්ෂු ශාසනයේ පසුබෑමකට ලක් වූ වකවානුව තුළ ගණින්නාන්සේලාගෙන් ඉටු වූ මෙහෙවර ඉතා වැදගත් විය.

මෙසේ ඇති වූ ශාසනික විලෝපනය නිසා භික්ෂූන් වහන්සේලාගේ තත්ත්වය ඉතා කණගාටුදායක ලෙස පිරිහුණි. මෙයට පිළියම් යෙදීමට තිරණය කළ විමලධම්සූරිය රජතුමා 1597 උපසම්පදාවට අවශ්‍ය භික්ෂූන් වහන්සේලා 20 ක් වත් ලංකාව තුළින් සොයා ගැනීමට නොහැකි වූ නිසා රක්ඛංග දේශයට දූත පිරිස් යවා නන්දිචක්ත, චන්ද, සීල මහ තෙරුන් ප්‍රමුඛ භික්ෂූන් වැඩම කරවා ගැටඹේ උදකුක්ඛේප සීමාවක් තනා උපසම්පදා කර්මයක් පැවැත්වී ය.[13] මෙම සිදුවීමත් සමග පරිහානිය කරා ගමන් කළ භික්ෂු ශාසනය යළි නගා සිටුවීමක් ඇති විය. ඒ අනුව උඩරට වෙහෙර විහාර නඩත්තු කර භික්ෂූන්ගේ අවශ්‍යතාවන් සපුරා ලීමට කටයුතු කරනු ලැබී ය. උඩරටට සාපේක්ෂ ව පහත රට ප්‍රදේශවල කතෝලික මිෂනාරීන් සමග බෞද්ධ සිංහල ආගමික අනන්‍යතාව පවත්වා ගෙන යාමට ගත් උත්සාහයේ දී පහත රටියෝ රජුගේ උපකාරය පැතූහ. ඒ අනුව රජතුමා තමාට හැකි ආකාරයෙන් සහයෝගය දැක්වීමට ක්‍රියා කරන්නට ඇතැ යි සිතිය හැකි වේ.

පළමු වැනි විමලධම්සූරියගෙන් පසු උඩරට වැදගත් රජු වූයේ දෙවැනි රාජසිංහ රජතුමා ය. ඔහුගේ රාජ්‍ය කාලයේ වැඩි කොටසක් ගත වූයේ ප්‍රතිකාලුන් මුහුදු බඩ පළාත්වලින් එළවා දැමීම ට ය. ඒ සඳහා ආධාරයට කැඳවා ගත් ඕලන්ද ජාතිකයින් ප්‍රතිකාලුන්ගේ පාලන බලය භුක්ති විඳීමට ක්‍රියා කරනු දුටු රාජසිංහ රජතුමා ඔවුන්ගේ කටයුතු වෙරළබඩ තීරයට පමණක් සීමා කිරීමට දැඩි උත්සහයක් ගත්තේ ය. මෙ නිසා සියවසකට ආසන්න කාලයක් සංඝ සංවිධානය ක්‍රමවත් සේ පවත්වාගෙන යාමට' අවශ්‍ය රාජකීය අවධානය යොමු කිරීමට උඩරට රජවරු අසමත් වූහ. මෙම කාලයේ භික්ෂු අධ්‍යාපනය පිරිහී භික්ෂු සංවිධානය වඩාත් දුර්වල වන්නට විය. ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශවල පාලන බලය ලන්දේසින් සතු වීම බුදු සසුනට එල්ල වූ තවත් තර්ජනයක් ලෙස පෙන්වා දිය හැකි ය. උඩරට අනාරක්ෂිත භාවය නිසා රුහුණට පලා ආ භික්ෂූන්ට සිදු වූයේ අනපේක්ෂිත ප්‍රශ්නවලට මුහුණ දීමට යි.[14] ලන්දේසීහු පෘතුගීසීන්ටත් වඩා

දරුණු අන්දමින් ආගමික මර්දනය දිගින් දිගට ම කළහ. මෙය බුදු දහමට පමණක් නොව කතෝලික ආගමට ද බලපාන ලදි. 1682 බෞද්ධාගම හා බෞද්ධ වත්පිළිවෙත් පැවැත්වීම නීති විරෝධී බවට ප්‍රකාශයට පත් කරමින් ආඥාවක් නිකුත් කිරීම ඊට කදිම උදාහරණයකි.[15]

මෙකල ලංකා ඉතිහාසයේ කිසි දිනෙක මුහුණ නොදුන් දුෂ්කර අවස්ථාවකට ලාංකික භික්ෂුවට මුහුණ පෑමට සිදු විය. අතීතයේ දී රජු එරෙහි වන විට ජනතාව භික්ෂූන් සමග සිටි අතර ජනතාව අසීරුවට පත්වන අවස්ථාවේ දී භික්ෂුව ජනතාව සමග සහායට ඉදිරිපත් වීම සාමාන්‍ය ලක්ෂණයක් බවට පත් ව තිබුණි. මින් පෙර සිදු නොවූ අන්දමින් සංඝ සමාජය පිරිහී ගියේ, සංඝයා ප්‍රතිපත්තිවලින් පිරිහී ගියේ එබඳු වාතාවරණයක් තුළ ය.[16] මෙම කාලයේ සංඝ සමාජයේ ස්වරූපය දෙස බලන විට 'සංඝ' යන උත්තරීතර පදවියෙන් ඉවත් වූ ගිහිකමටත් පැවිදි කමටත් නැති භික්ෂු පිරිසක් මේ කාලයේ විසූහ. මීට ඉහත දී පෙන්වා දුන් පරිදි ද ඔවුහු ගණින්නාන්සේලා වූහ. සිවුරක් පොරවා ගෙන ඊට උඩින් පටියක් බැඳීම මොවුන්ගේ සාමාන්‍ය ඇඳුම වූ අතර[17] සමහරුන් යටින් කසාවතක් හැඳ ඊට උඩින් සුදු රෙද්දක් ඇඳ සිටි බව පෙනේ. සඟරජවතෙහි දක්වෙන අන්දමට ඔවුන් අඹුදරුවන් පෝෂණය කිරීමෙහි ද යෙදී ඇතැයි පෙනෙතත් රොබට් නොක්ස් කියන්නේ වැඩපළෙහි නිතර වීමත් ස්ත්‍රීන් සරණ පාවා ගැනීම හා ස්පර්ශ කිරීම පවා තහනම් වූ බව යි.[18] එනමුත් ප්‍රතිකාල් පාලන සමයේ දී පහත රට ප්‍රදේශවල බෞද්ධ වත්පිළිවෙත් පවත්වාගෙන යාමට ගණින්නාන්සේලාගෙන් ලැබුණු මෙහෙය ඉතා වැදගත් වේ. පාලි, සිංහල, සංස්කෘත, භාෂා සහ උසස් විද්‍යාත්මක දැනුම නොලැබී ගිය ද දැනුම ඇතුළත් පොත පත ආරක්ෂා කිරීමට ඔවුහු දායක වූහ. ක්‍රිස්තියානි පීඩන යටතේ වුව ද ඔවුන් විසින් බෞද්ධ කටයුතු අඛණ්ඩ ව කරනු ලැබී ය. මීට අමතර ව දේශීය වෛද්‍යවරුන් ග්‍රාමීය ජනතාවගේ සෞඛ්‍යාරක්ෂිත කටයුතුවල යෙදෙමින් පැරණි ශාස්ත්‍රීය දැනුම ආරක්ෂා කිරීමට ද ඇප කැප වූහ. පැරණි ශාස්ත්‍රීය දැනුම ආරක්ෂා කළ තවත් කොටසක් වූයේ විදේශීය පාලකයන්ට ඇම්බැට්ටකම් කළ දේශීය මුලාදැනි පන්තිය යි. තනතුරු සහ ඉඩකඩම් ලබා ගැන්ම සඳහා ඔවුහු ක්‍රිස්තියානි ආගම වැළඳ ගත්ත ද බෞද්ධ ජීවන ක්‍රමය සම්පූර්ණයෙන් ම අත් නොහළහ. එනිසා 17-18 වැනි සියවස්වල සාහිත්‍ය කලාවේ අභිවෘද්ධිය සඳහා ක්‍රියා කළ විශාල පිරිසක් මුලාදැනීන් අතර වූහ.

සමස්තයක් වශයෙන් ගත් කල 17 වැනි සියවසේ පහතරට ප්‍රදේශවල ශාස්ත්‍රීය දැනීම විෂයෙහිලා වූ මූලික මෙහෙය වූත් ඒ දක්වා

සාහිත්‍ය කලා ශිල්පවලට භික්ෂූන් වහන්සේලා හිමි කරගෙන තිබූ තත්ත්වය
ගිහියන් අතට පත් විය. ගණින්නාන්සේලා පීඩනය ප්‍රබල ව පවතිද්දී
සුදුවත් හැඳ ආගමික කටයුතුවල සහ බෞද්ධ හැඟීම් කුල්මත් කිරීමක
යෙදුණහ. බෞද්ධයන්ට ආගමික වත් පිළිවෙත්වල යෙදීමට භික්ෂූන්
වහන්සේලාගේ සහභාගිත්වය අත්‍යවශ්‍ය නොවී ය. කාලයක් තිස්සේ
සාමූහික ස්වරූපය කරගත් වැඳුම් පිදුම් හා වත් පිළිවෙත් රාශියක්
බෞද්ධයන් සතු විය. එනිසා ප්‍රතිතාල් බලය යටතේ වුව ද
ගණින්නාන්සේලාගේ සහයෝගය ඇති ව ආගමික කටයුතුවල නිරත
වීමට බෞද්ධයන්ට අවස්ථාව ලැබුණි.

මෙසේ කටයුතු සිදුවෙද්දී බෞද්ධ ජනතාව උඩරට රජතුමා
සමග ඉතා සමීප ව ක්‍රියා කරන්නට විය. මේ සම්බන්ධතාවට නොදෙවැනි
ආකාරයෙන් උඩරට භික්ෂූන් වහන්සේලා සහ පහත රට ගණින්නාන්සේලා
අතර ද සම්බන්ධතාව ගොඩ නැගුණි. උඩරට රාජ්‍යය නිදහස් රාජ්‍යයක්
වශයෙන් පැවතීමත් එහි පාලකයා බෞද්ධයන්ගේ ආරක්ෂකයා වශයෙන්
පෙනී සිටීමත් නිසා උඩරට රාජ්‍යයට ආසන්න මුහුදුබඩ පළාත්වල බෞද්ධ
කටයුතු අතිශයින් ම ක්‍රියාත්මක විය.

දෙවැනි රාජසිංහට පසු ව උඩරට සිහසුනට පත් වූයේ දෙවැනි
විමලධර්මසූරිය රජතුමා ය. මොහු ලන්දේසීන් සමග තරමක සහනශීලි-
භාවයකින් කටයුතු කරනු ලැබූ අතර විනාශ කළ බෞද්ධ හා හින්දු
ආගමික මධ්‍යස්ථාන යළි පුනරුත්ථාපනය කළේ ය.[19] කෙසේ වෙතත්
උඩරට භික්ෂු ශාසනය ඉතා ඉක්මනින් අඩපණ වී ගියේ ය. එයට හේතු
වූයේ රජතුමා සහ ප්‍රභූන් විසින් පන්සල්වලට භවබෝග සම්පත් පරිත්‍යාග
කළ බැවින් ඔවුහු භික්ෂු ජීවිතය අමතක කර දැමීම යි. එයට හේතු
වන්නට ඇත්තේ සමකාලීන ව උඩරට පැවති ක්‍රිස්තියානි බලය යි. බුද්ධ
ශාසනය ශක්තිමත් පදනමකින් පවත්වාගෙන යාමට රාජකීය අධීක්ෂණය
අවශ්‍ය වූයේ භික්ෂූන් සතු මධ්‍යම සංවිධානයක් නොවීම නිසා ය.
උඩරට රජවරුන් සිය බිසෝවරුන්ගේ අවශ්‍යතාව සපුරාගනු ලැබුවේ
ඉන්දියාවෙනි. මෙම දේවීන් වහන්සේලා හින්දු වූ බැවින් සිංහල රජකුගේ
ඉපැරණි බෞද්ධ රැජිනකගෙන් සංඝ ශාසනයේ උන්නතිය උදෙසා කිසිදු
සේවාවක් නොලැබුණි. සමාජයේ අර්බුද හමුවේ භික්ෂූන්ගේ ගුණ දහම් ද
පිරිහී ගියේ ය. එනිසා උපසම්පදා කර්මය සහ උසස් භික්ෂු ගුණාංග
වර්ධනය කිරීම ගැන අඩු අවධානයක් දක්වූහ.

මෙවැනි තත්ත්වයක් තුළ උපසම්පදාව ඇති කිරීමේ අවශ්‍යතාව
වඩාත් වැදගත් විය. එනිසා රජතුමා ඕලන්ද ජාතීන් සමග පැවැත්වූ

සාකච්ඡා මගින් රක්ඛංග දේශයෙන් භික්ෂූන් වැඩම කිරීමට යාත්‍රා පහසුකම් ඉල්ලා ඇත. ලන්දේසීන් සිංහල රජයට උදව් කිරිමට ඉදිරිපත් වීම තුළ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණයක් වූයේ වාණිජ අරමුණු බව වඩාත් පැහැදිලි ය. 1696 රක්ඛංග දේශයෙන් මෙරටට වැඩම වූ ලෝත, රාග, පුද්ගල සංකිච්ච, ආදි උපසම්පදාව ලබා තිබූ භික්ෂූන් වහන්සේලා තිස්තුන් නමක් ගැටඹේ උපසම්පදාව සිදුකර නැවත මෙරට භික්ෂු සමාජය පුනර්ජීවනය කරනු ලැබී ය. එනමුත් මෙම උපසම්පදා කර්මය පිළිබඳ විවිධ මතවාදයන් ඇති වූ බව පෙනේ. ගල්මුල්ලේ රතනපාල හිමියන් පෙන්වා දෙන පරිදි මෙම උපසම්පදා කර්මයේ එක් අරමුණක් වූයේ එකල විහාර දේවාලගම් අයිතිය පිළිබඳ පැන නැගි ඇති අර්බුදයක් සංසිඳීම ය.[20] එනිසා මෙයින් අවබෝධ වන්නේ අපේක්ෂිත පරමාර්ථ කොතෙක් දුරට ඉටු වූවා ද යන්න යි.

දෙවැනි රාජසිංහට අනතුරු ව ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා බලයට පත් විය. මොහු විසින් මුල් වකවානුවේ භික්ෂූන් වහන්සේලාට සහ විහාරස්ථානවලට උපකාර කරනු ලැබී ය. එනමුත් තම දේවිය දස්කොන් අධිකාරම සමග ඇති කරගත් ප්‍රේම සම්බන්ධතාවට එවකට රාජගුරු භික්ෂුව වූ සූරියගොඩ කිත්සිරිමෙවන් රාජසුන්දර හිමියන්ගේ සහයෝගය දැක්වීම නිසා භික්ෂූන් වහන්සේලා සමග පැවති සබඳතා අඩු කිරීමට හේතු විය. මෙම අවස්ථාවේ දී උඩරට රාජධානියේ ආරක්ෂාව ලැබූ කතෝලික පූජකයන්, විශේෂයෙන් ම ගොන්සාල්වේස් පියතුමාට රජුගේ සිත් දිනා ගැනීමට හැකි විය.[21] සංඝ සංවිධානයේ පවතින දුර්වලතා රජුට පෙන්වා දෙමින් රජු සහ භික්ෂූන් අතර පරතරයක් ඇති කිරීමට කතෝලික පූජකයන් විසින් ක්‍රියාකර තිබේ. මෙසේ රාජ අනුග්‍රහය භික්ෂූන් වෙත නොලැබීමත් සමග ම සංඝ සංවිධානය තුළ ද නොයෙක් අඩුපාඩු දුර්වලතා මතු වන්නට විය. ඒ තුළ භික්ෂු ජීවිතය ලෞකිකත්වයට බර වී දේපොළ ආරක්ෂා කිරීමට ක්‍රියා කරන පිරිසක් ලෙස ඔවුන් ජීවත්ව තිබේ. උඩරට තත්ත්වය මෙසේ වුව ද පහත රට කේන්ද්‍ර කරගෙන ගණින්නාන්සේලා බෞද්ධ ජනතාවගේ ආරක්ෂාව යටතේ සිය කටයුතු සංවිධානය කර ඇත. ඒ අනුව තොටගමු පුරාණ විහාරය, කැලණි රජමහා විහාරය හා වැලිගම අග්‍රබෝධි විහාරය වැනි ඒවා පිළිසකර කර බෞද්ධ කටයුතු සිදුකරනු ලැබී ය.[22] මෙලෙස මුහුදුබඩ පළාත්වල බෞද්ධාගමික කටයුතු ශක්තිමත් වීම නිසා ලන්දේසීන් බුද්ධාගම සම්බන්ධයෙන් ගෙනගිය ප්‍රතිපත්තියේ ද වෙනස් වීමක් 17 වැනි සියවස අවසාන වන විට දක්නට ලැබේ. එයට හේතු වන්නට ඇත්තේ ලන්දේසීන්

බුදුදහමට එරෙහි ව කොපමණ නීති රීති පනවා බෞද්ධාගම විනාශ කිරීමට උත්සාහ ගනු ලැබුවත් බහුතර ජනතාවගේ ආගම ලෙස එය කෙසේ හෝ රැකගැනීමට සිංහලයන් උත්සුක වූ බව මනා ව පැහැදිලි වන කාරණයකි. එය වඩාත් පැහැදිලි වන්නේ ලන්දේසීන් වෙරළබඩ හැර සෙසු ප්‍රදේශවල පන්සල් සෑදීම සඳහා අවසර ලබා දී ඇති බැවිනි. ප්‍රධාන වශයෙන් ලන්දේසීහු කුරුඳු සඳහා වැඩි ලොල් භාවයක් දැක්වූහ. මේ තත්ත්වය තුළ පහත රට කුරුඳු වගාව තරමක් දුරට පසුබෑමකට ලක් වුවත් උඩරට කුරුඳු ලබාගැනීමට සිංහල රජු සමග සමීප සම්බන්ධතාවක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය විය.[23] ඒ අනුව රජුගේ ඉල්ලීම පිට පවා පහතරට බුද්ධාගම සම්බන්ධයෙන් අනුග්‍රහශීලී ප්‍රතිපත්තියක් ගෙන යෑම ලන්දේසීන්හට අකැමැත්තෙන් වුව ද කිරීමට සිදු විය.

පහතරට ඇති වූ බෞද්ධ ප්‍රබෝධයට හේතු වූයේ සියම් නිකායේ පහතරට ආරම්භකයා යැයි හඳුන්වන වේහැල්ලේ ධම්මදින්න හිමියන් අතිනි.[24] මෙම කාලයේ සිටි ගණින්නාන්සේලාගේ ඇසුර ලබා ධර්ම ශාස්ත්‍රීය දැනුම ඇති කිරීමට ක්‍රියා කළහ. ශාස්ත්‍රීය දැනුම සොයා සැරිසරා පැවති පොත්පත් සෙවීමට උත්සාහ ගෙන තිබේ. පහතරට ගණින්නාන්සේලාගේ ද සහාය ඇති ව වේහැල්ලේ ධම්මදින්න හිමියන් ඉටු කළ කාර්ය භාරය ප්‍රශංසනීය වේ. ඒ වාගේ ම ශාසනික පරිහානි කාලයේ ගණින්නාන්සේලා පෞද්ගලිකවත් පොදුවේත් තම ඓතිහාසික යුග මෙහෙවර ඉටු කළහ.

ලන්දේසී කටයුතු වඩාත් ප්‍රබල ව පැවති ගාල්ල, කොළඹ ආදි ප්‍රදේශවල බෞද්ධ කටයුතු වඩ වඩාත් කාර්යක්ෂම විය. මෙසේ බෞද්ධ කටයුතු ඉස්මතු වීමත් සමග ම ක්‍රිස්තියානි ජන සංඛ්‍යාව ද පහළ බසින්නට විය. ඒ වාගේ ම උඩ රටින් භික්ෂූන් වහන්සේලා විවිධ කාරණා පදනම් කර ගෙන මුහුදුබඩ පළාත්වල සැරිසැරූහ.[25] ඇතැම් භික්ෂූන් පිණ්ඩපාතේ වැඩි බවට තොරතුරු ඇත. 1706 උකුවෙලින් පිටත් වූ භික්ෂූන් වහන්සේ නමක් තවත් භික්ෂූන් වහන්සේලා පහළොස් නමක් පිරිවරා අසනීපයකට වෛද්‍ය ප්‍රතිකාර ලැබීමට වැලිගම බලා සංචාරය කරද්දී අතරමග ආපසු හරවා යැවීමට නිලධාරීහු ක්‍රියා කළහ.[26] ඇතැම් අවස්ථාවල උඩරට භික්ෂූන් වහන්සේලා රජුගේ අනුග්‍රහයෙන් ද ලන්දේසී නිලධාරීන්ට දන්වා විවිධ කාර්යයන් සඳහා සමූහ වශයෙන් ද මුහුදුබඩ පළාත්වල සංචාරය කළහ. එසේ පැමිණි භික්ෂූන් ගම් දොරටුවල දී මහත් හරසරින් පිළිගෙන ගම්මුන් විසින් සංවිධානය කළ උත්සව සඳහා ද වැඩම කර තිබේ.[27]

මෙසේ දහ අටවැනි සියවස ආරම්භ වන විට හම්බන්තොට, මාතර, හා ගාලු දිස්ත්‍රික්කවල ක්‍රමවත් ආකාරයෙන් බෞද්ධ ප්‍රබෝධයක් ඇති විය. මුල්කිරිගල විහාරය ආශ්‍රයෙන් ද ප්‍රබල බෞද්ධ ප්‍රවාහයක් වර්ධනය විය. මෙම ස්ථානය ගණින්නාන්සේලාට වඩාත් ආරක්ෂිත ස්ථානයක් බවට පත් විය. වටරක්ගොඩ ධර්මපාල හිමියන් විසින් මෙහි ශාස්ත්‍රීය කටයුතුවල අභිවෘද්ධියට ක්‍රියා කළ ප්‍රධාන භික්ෂූන් වහන්සේ විය. මෙම විහාරය පමණක් නොව ගාලු දිසාවේ තොටගමු වෙහෙර ආශ්‍රිත ව ද බෞද්ධ පුනර්ජීවනය ඇති විය. සියවසකට වැඩි කලක් දරුණු ආගමික පීඩනයට ලක් ව සිටි බෞද්ධයෝ අධිරාජ්‍ය බලය ඉදිරියේ තවදුරටත් ශාසනික දේපොළ විනාශ කරනු බලා සිටීමට සූදානම් නො වූහ. විනාශ වී ගිය ගොඩනැගිලිවල ආසන්නයේ තවකාලික ව ඉදි කළ ගොඩනැගිලිවල බණ කීම හා පරිත්‍රාණ ධර්ම දේශනා පවත්වන ලදි. මෙම කටයුතුවල ප්‍රධාන මුලිකත්වය දරුණු ලැබුවේ උඩරටින් වැඩම කළ භික්ෂූන් වහන්සේලා ය.

ක්‍රි. ව. 1739 න් පසු උඩරට රාජධානියේ සිහසුන සඳහා නායක්කාර වංශිකයන් උරුමකම් කියනු ලැබූහ.[28] ශ්‍රී විජය රාජසිංහ, කීර්ති ශ්‍රී රාජසිංහ ආදි වශයෙන් නායක්කාරවරු කිහිප දෙනකු ම සිහසුනට පත් වූහ. විශේෂයෙන් ම නායක්කාරවරුන්ගේ බලයට පැමිණීමත් සමග මෙරට සංඝ ශාසනයේ නව වකවානුවක් ඇති විය. එයට හේතු වූයේ ඔවුහු පාරම්පරික ව හින්දු භක්තිකයන් වුව ද බෞද්ධාගමේ උන්නතිය සඳහා ක්‍රියා කළහ. මෙම අවධියේ භික්ෂු ශාසනය ගැන අවධානය යොමු කිරීමේ දී ඉතා වැදගත් මෙහෙවරක සරණංකර හිමියන්ගේ සේවය ඉතා වැදගත් වෙයි. උඩරට රජුන්ගේ ගුරුවරයා වීම නිසා අනෙක් භික්ෂූන් වහන්සේලා අතර කැපී පෙනෙන්නට විය. පහත රට භික්ෂූන් ආගම ඇදහීමේ ජන්ම අයිතිය සඳහාත් වෙහෙසුණු අතර සරණංකර හිමි ප්‍රමුඛ උඩ රට භික්ෂූන් වහන්සේලා භික්ෂු අධ්‍යාපන සංවර්ධනය කළ භික්ෂු ජීවිතය ආගමානුකූල ව යළි සකස් කිරීම සඳහා අත්‍යවශ්‍ය වූ උපසම්පදාව ලබා ගැනීමට ක්‍රියා කළහ. උන්වහන්සේ ශාසන ශෝධනයේ පෙරමුණ ගෙන හිටියා පමණක් නොව 'රාජගුරු' යන ගෞරව තත්ත්වයෙන් පිදුම් ලැබුවේ ය.

උපසම්පදාව ඇති කිරීමට ගනු ලැබූ උත්සාහයන් කිහිප අවස්ථාවක දී ම අසාර්ථක වුව ද 1752 න් මෙරටින් පිටත් වූ විල්බාගෙදරගේ නායකත්වයෙන් උපසම්පදාව සඳහා අවශ්‍ය උපසම්පන්න භික්ෂූන් ඇතුළු ව 1753 දී දූත පිරිස මෙරටට පැමිණියහ.[29] අනතුරු ව ඇසළ පොහෝදා උපසම්පදාව පවත්වා අස්ගිරියේ නාවින්න හිමි ඇතුළු භික්ෂූන් විශාල

පිරිසක් උපසම්පදාව ලැබූහ. මෙම උපසම්පදාව ලබාගැනීම සඳහා පහත රටින් ද භික්ෂූන් වහන්සේලා විශාල පිරිසක් පැමිණ ඇත. සිටිනාමළුවේ ධම්මජෝති හිමියෝ හා වෙහැල්ලේ ධම්මදින්න හිමියෝ ඒ අතර ප්‍රමුඛ වූහ.

මෙසේ උපසම්පදාව මුල් කර ගෙන භික්ෂු ශාසනයේ නව අභිවෘද්ධියක් ඇති වන අතර ම පිරිවෙන් කේන්ද්‍ර කරගනිමින් බෞද්ධ අධ්‍යාපනික ආයතන ද ආරම්භ වී තිබිණ. කුණ්ඩසාලේ, නියමකන්ද, පෝයමළුව, අස්ගිරි, සුදුහුම් පොළ, අම්පිටිය, නිත්තවල, ගංගාරාමය ආදි විහාරස්ථාන ඒ අතර ප්‍රධාන විය.[30] සරණංකර හිමි ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලාගේ සාමූහික උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස උසස් ශාස්ත්‍රීය හා ආගම් ධර්ම පිළිබඳ ප්‍රවීණ බවක් තිබූ සංඝ හා ගිහි පරපුරක් බිහි විය. ඒ වගේ ම මෙම අධ්‍යාපන ආයතනවලට ගාල්ල, මාතර, හම්බන්තොට, සත්කෝරළය, සහ නුවර කලාවිය ආදී ප්‍රදේශවලින් ද භික්ෂූන වහන්සේලා උසස් අධ්‍යාපනය සඳහා පැමිණියහ. උඩරට රජතුමාගෙන් ලැබුණු පහසුකම් මධ්‍යයේ අධ්‍යාපනය හමාර කළ භික්ෂූහු තම ප්‍රදේශවලට ගොස් ආගමික කටයුතුවල නිරත වූහ. පහතරට ප්‍රදේශයන්හි ලන්දේසීන්ගේ බලය තිබුණ ද බෞද්ධාගමිකයන්ට හිංසනයක් නොවුණු බව පෙනේ. එයට හේතු වන්නට ඇත්තේ උඩරට කේන්ද්‍ර කර ගනිමින් ප්‍රබල බෞද්ධ සංවිධානයක් ක්‍රියාත්මක වීම නිසා ය. ඒ වගේ ම 19 වැනි සියවසේ අවසාන භාගය වන විට මෙරට සංඝ සංවිධානයේ නව නිකායන් කිහිපයක ආරම්භයන් සනිටුහන් විය. එනමුත් නිකායන්තර මතවාද දක්නට ලැබුණ ද මෙරට සමාජ, සංස්කෘතික අංශයේ අභිවෘද්ධියට භික්ෂූන්ගෙන් ලැබුණ සහයෝගය ඉතා වැදගත් විය.

ලන්දේසී බලය 1796 මුහුදුබඩ පළාත්වලින් හිමි කර ගත් ඉංගසීන් විසින් මෙරට බලය ක්‍රමානුකූල ව ගොඩනගනු ලැබී ය. එතැන් සිට මෙරට ඉතිහාසය ඉතා තීරණාත්මක කාල පරිච්ඡේදයක් විය. විශේෂයෙන් ම පෙර අවධියට නොදෙවැනි ආකාරයෙන් භික්ෂූන් වහන්සේගේ නායකත්වය කැපී පෙනෙන්නට විය. ඉංග්‍රීසීන් ද පෘතුගීසී හා ලන්දේසීන් මෙන් ම බුද්ධාගම හා සිංහල ශිෂ්ටාචාරය විනාශ කිරීමටත්, ක්‍රිස්තියානිය සහ බටහිර ශිෂ්ටාචාරය පැතිර වීමෙන් සිංහල රාජ්‍ය ගැන රට වැසියන් තුළ කලකිරීමක් ඇති කිරීමටත් ඉංග්‍රීසි ආණ්ඩුව කටයුතු යෙදී ය.[31] සිංහල ජාතියේත් ලංකා බුද්ධ ශාසනයේ නිදහස 1815 මාර්තු 25 මහනුවර දී ඉංග්‍රීසීන්හට යටපත් විය. ඉංග්‍රීසින් මෙරට ස්වාධීනත්වය උරුම කර ගන්නා අවස්ථාව තුළ දී පවා, ශ්‍රී සුමංගල හිමියන් විසින් කරන ලද වීර

ක්‍රියාව අද පවා මෙරට වැසියන් සිහිපත් කරනුයේ ගෞරව අභිමානයෙනි. ජාතිය හා ආගම විපතට පත් වන හැම අවස්ථාවක දී ම භික්ෂූන් ඉදිරිපත් වී එය ආරක්ෂා කර ගැනීමට ක්‍රියා කළ ආකාරය එයින් මනාව පැහැදිලි වේ.

බ්‍රිතාන්‍යයන් බලය ස්ථාපිත කළ මුල් අවධියේ දී පහතරට භික්ෂූන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කර සමීප සබඳතාවක් ගොඩනගා ගැනීමට නෝර්ත් හා මෙට්ලන්ඩ් ආණ්ඩුකාරවරු ක්‍රියා කළහ. රදළවරයකු භුක්ති විඳින සමාන අයිතිවාසිකම් හා බලයක් පැවති අතර උඩරට රජුගේ බලයට බලපෑම් කිරීම සඳහා යටත් විජිත පාලකයන් නායක භික්ෂූන් සතුටු කිරීමට වගබලා ගෙන ඇත.[32] මෙට්ලන්ඩ් ආණ්ඩුකාර සමයේ භික්ෂූන්ට සහාය දක්වමින් දකුණු පළාතේ භික්ෂූන්ගේ කොමිටියක් ද සංවිධානය කිරීමට ආධාර විය.[33] මෙම කොමිටියේ නායක ස්වාමීන් වූයේ කරතොට ධම්මාරාම හිමියන් වූ අතර බ්‍රිතාන්‍ය රජය විසින් වේතනයක් ද ගෙවනු ලැබුවේ ය. මෙයින් අවබෝධ වන්නේ භික්ෂූන් වහන්සේලා තමන් වෙත නතු කර ගැනීමට දේශපාලන වශයෙන් බලය තහවුරු කර ගැනීමට උපකාරී වන බව ඉංග්‍රීසි විසින් අවබෝධ කර ගත් කරුණක් බව යි. මහනුවර රාජ්‍ය බලය පවතින්නේ බුද්ධාගම නිසා ය යනුවෙන් 1805 පෙබරවාරි 27 නොර්ත් ආණ්ඩුකාර තැන එනංගලන්තයේ තැට්ඩන්සාමි වෙත යවන ලද ලිපියක සඳහන් වේ. ඒ වගේ ම මෙට්ලන්ඩ් ආණ්ඩුකරු මාතර ඒජන්ත වූ ඊඩින් වෙත යවන ලද ලිපියක භික්ෂූන්ගේ බලය විශාල ය. නොයෙක් කරුණුවල දී එය මුදලිවරුන්ගේ බලයටත් වඩා විශාල බව පෙන්වා ඇත. මෙයින් මෙරට සමාජය තුළ භික්ෂූන් සතු ව පැවති බලය මනා ව පැහැදිලි වේ. විහාර දේවාලගම් ආශ්‍රිතව ද මිනිස්සු සිය රාජකාරිය ඉටු කිරීමේ දී භික්ෂූන්ට අවනත වූහ. එයට හේතු වූයේ ගිහියන්ගේ ගෘහාශ්‍රිත කටයුතුවල දී ඉගැන්වීම, වෙදකම වැනි කටයුතුවල පෙරමුණ ගත්තේ ඔවුන් විසින් වීම ය. මෙසේ මහජනයා අතර පැවති භික්ෂූන්ගේ බලය සමාජයේ දියුණුව සඳහා ප්‍රයෝජනවත් ලෙස යොදන ලදි.[34]

බ්‍රිතාන්‍ය ආණ්ඩුව යටතේ මෙරට වැසියන්ට එතරම් කාලයක් සැනසිල්ලේ ගත කිරීමට නො හැකි විය. ඔවුන්ගේ පාලනයේ පැවති අසහනකාරී පීඩනයට එරෙහි ව 1818 සහ 1848 දී නැගී සිටියහ. ආගමික නිදහස සඳහා හටගත් මෙම කැරලි කෝලාහල භික්ෂූන්ගේ මූලිකත්වයෙන් ආරම්භ විය. 1818 කැරැල්ල ආරම්භ වීම සඳහා භික්ෂූන් මැදිහත් වූ බව එල්. ඒ. විල්ස් මහතා 'බ්‍රිතාන්‍ය පාලනය යටතේ ලංකාව' නම් කෘතිය

මගින් පෙන්වා දී ඇත.[35] ඒ වගේ ම 1848 වන විට ටොරින්ටන් ආණ්ඩුකාරවරයා විසින් හඳුන්වා දුන් නව බදු ප්‍රතිපත්තිය නිසා දේශීය සමාජයේ පිරිස් කැරැල්ලක් මෙහෙයවා තිබේ. මෙම කැරැල්ලේ ද පෙරමුණ ගෙන ක්‍රියා කළේ භික්ෂූන් වහන්සේලා විසින් බව ජෝන් එස්. කෙප්ලර් විසින් යටත් විජිත ලේකම්ට යැවූ ලිපියේ සඳහන් වේ. මෙම කැරැල්ලේ නායකත්වය ගත් ප්‍රධාන භික්ෂූන් වහන්සේ ලෙස දඹුලු විහාරයේ ගිරානේගම චන්ද්‍රජෝති හිමියන්, කුඩාපොළ හිමි ඇතුළු තවත් භික්ෂූන් කිහිප නමක් ප්‍රමුඛ විය. මෙම කැරැල්ල අවසානයේ සිදු වූ ඛේදජනක සිදුවීම වූයේ කුඩාපොළ හිමියන් සිවුර පිටින් වෙඩි තබා ඝාතනය කිරීමට ටොරින්ටන් විසින් නියෝග කරණු ලැබීම ය. ඒවගේ ම විශාල පිරිසක් ද ඝාතනය කරන ලදි. කැරලි මර්දනය කිරීමට ආණ්ඩුකරු අනුගමනය කළ ප්‍රතිපත්තිය ගැන එතරම් දුරට සෑහීමට පත් නොවී මව් රජය ටොරින්ටන් ආපසු ගෙන්වා ගත්තේ ය.[36] මේ ආකාරයට පුරාතන අවධියේ සිට ම ගිහි පැවිදි දෙපක්ෂය ම මෙරට අභිවෘද්ධිය උදෙසා ආත්ම පරිත්‍යාගයෙන් කටයුතු කිරීමට ඉදිරිපත් වීම ද මෙම වකවානුවේ දී තව තවත් වර්ධනය වූ බව පෙනේ.

ලංකාව තුළ සාර්ථක පාලනයක් ගෙන යාමට නම් සමාජයේ පවතින ගිහි පැවිදි සමීප සබඳතාවය බිඳිය යුතු බව බ්‍රිතන්‍යයන් විසින් අවබෝධ කරගන තිබේ. ඒ සඳහා භික්ෂු සමාජය මහජන සේවයෙන් ඈත්කොට ඔවුන්ගේ බලය විනාශ කිරීමට බ්‍රිතාන්‍යයන් ප්‍රයත්න දැරී ය. එය මනා ව පැහැදිලි වන්නේ කරතොට ධම්මාරාම සහ බෙරවල ස්වාමීන් වහන්සේලා අතර භේදයක් ඇති කිරීමට බ්‍රිතන්‍යයන් ගනු ලැබූ උත්සාහය තුළිනි. 1815 උඩරට ගිවිසුමේ පස් වැනි වගන්තිය මගින් භික්ෂූන් වහන්සේලාගේ සහ උඩරට ප්‍රභූන් ප්‍රමුඛ විහාර දේවාලගම් ආරක්ෂා කිරීමට බැඳි ක්‍රියා කිරීම ගැන පසු කාලය වන විට මෙරට සහ බ්‍රිතාන්‍යය මව් රාජ්‍යය තුළ දැඩි විරෝධතාවයක් ඉස්මතු විය. ම්ලේච්ඡ පෙති පිළිමකරුවන් අදහන ආගම ආරක්ෂා කිරීමට ක්‍රිස්තියානි රජයක් දරණ උත්සහාය ගැන මෙරට මිෂනාරීන් දැඩි සේ විරෝධය පා තිබේ. ස්පෙන්සර් හාඩි වැනි මිෂනාරීන්ගේ විවේචනයන් මගින් දැඩි පහරක් බුදු දහමට එල්ල විය. ඉංග්‍රීසි රජය එම කටයුතුවලින් සම්පූර්ණයෙන් ම ඉවත් විය යුතු බව පෙන්වා දී ඇත.[37] මෙසේ 1840 ගණන් වන විට බෞද්ධ ප්‍රශ්නය සම්බන්ධයෙන් තවදුරටත් මතභේද ඉස්මතු වන්නට විය. ආණ්ඩුකාරවරයා විසින් ඒ ඒ විහාරවල මහානායක හිමිවරුන් අධිපතීන් පත් කිරීම ගැන මිෂනාරීහු විරුද්ධ වූහ. එහි ප්‍රතිඵලයක් ලෙස විලියම් මැකෙන්සි

ආණ්ඩුකාරතුමා විහාරවල අධිපතින් පත් කිරීමට සහතික පත්‍ර අත්සන් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබී ය. මෙසේ ටික කලක් ගත වීමෙන් පසු 1847 ටොරින්ටන් ආණ්ඩුකාරතුමා දළදාවේ භාරකාරත්වය මල්වතු හා අස්ගිරි උභය විහාරීය නායක හිමිවරුන්ට හා දියවඩන නිලමේතුමාට භාර කිරීමත් දළදා මාළිගාවට වාර්ෂික ව ලබාදුන් පවුම් 300 ලබා නො දීම හා එහි ආරක්‍ෂාවට රඳවා සිටි සෙබළුන් ඉවත් කිරීමත් සමග බුදු දහම හා ඉංග්‍රීසීන් අතර නව කාල පරිච්ඡේදයක් උදා විය. විහාර දේවාලගම් පාලනය පිළිබඳ වගකීමෙන් බ්‍රිතාන්‍යයන් ඉවත් වීමත් සමඟ භික්ෂූන්ගේ චරිතය කිලුටු වන්නට විය. එසේ ම ගිහි පැවිදි දෙපක්ෂයේ සමාදානයට ද මෙයින් බරපතල හානි සිදු විය. එහි අවසාන ප්‍රතිඵලය වූයේ බෞද්ධ බලය හා බෞද්ධ කටයුතු ද පිරිහීම ය.

මේ ආකාරයට මිෂනාරීන්ගේ බලපෑම හමුවේ ගොඩ නගා ගත් නව ප්‍රතිපත්තිය නිසා රජය හා ආගම අතර සම්බන්ධතාවත් බෞද්ධ ආගමේ පිරිහීමට බලපෑවේ ය. ඉංග්‍රීසීන්ගේ ක්‍රියාදාමය නිසා 1855 වන විට බෞද්ධාගම සම්බන්ධ කටයුතු සියල්ල ම බුඩිස්ට් ඒජන්සි (Buddhist Agency) භාර විය.[38] ඒ අනුව ලංකාව යටත් කරගත් අවධියේ සිට බුද්ධාගම හා රජය අතර සබඳතාව යහපත් ආකාරයෙන් පැවතුණ ද එය නැති කිරීමට ගනු ලැබූ උත්සාහය ඉහත වර්ෂයේ දී සාර්ථක විය. මෙසේ බෞද්ධ බලය විනාශ කිරීමට ක්‍රියා කිරීමේ දී ක්‍රිස්තියානියේ අභිවෘද්ධියට ක්‍රියා කළහ. ක්‍රිස්තියානි පාසැල් විවෘත කොට ඒ සමග බටහිර සභ්‍යත්වය රටේ පතුරවා හැර සිංහල බෞද්ධ සභ්‍යත්වය නො වැදගත් ආකාරයෙන් පෙන්වා ගිහි පැවිදි සබඳතාව බිඳීමට බ්‍රිතාන්‍යයෝ ක්‍රියා කළහ. බොහෝ බෞද්ධයින් ක්‍රිස්තියානියට හරවා ගැනීමත් සමඟ භික්ෂූන්ගෙන් සිදු වූ මහජන සේවය මිෂනාරීන් සතු වීම නිසා භික්ෂුව සමාජයෙන් තරමක් දුරට ඈත් විය.

බටහිර සභ්‍යත්වය මෙරට මුල්බැස ගැනීමෙන් පසු නව සාමජ, දේශපාලන, ආර්ථික රටාවට භික්ෂූන්ට මුහුණ දීමට සිදු වුව ද එය තරමක් දුරට අපහසු කාර්යයක් විය. පිරිහුණු සමාජ ක්‍රමය තුළ භික්ෂුව සාංඝික දානය, පිරිත් කීම, පාංශුකූලය හා මතක බණ කීම වැනි කාර්යයන්ට සීමා විය.[39] කොතෙක් දුරට සමාජය විපතට පත් වුවත් භික්ෂූන් සිංහල සංස්කෘතිය උතුම් කොට සලකා එහි අභිවෘද්ධියට දිවි හිමියෙන් කටයුතු කළ බව පෙනේ.

19 වැනි සියවසේ අවසන් භාගය වන විට නැවතත් මෙරට තුළ බෞද්ධ පුනර්ජීවනයට අවශ්‍ය පසුබිම සැකසිණි. එහි දී ප්‍රධාන වශයෙන්

භික්ෂූන් වහන්සේලාගේ නායකත්වය යටතේ එම ප්‍රබෝධය වර්ධනය විය. විශේෂයෙන් ම දොඩන්දූවේ පියරතන හිමියන්ගේ උත්සාහයෙන් 1869 ලක්දිව පළමු බෞද්ධ පාඨශාලාව දොඩන්දූවේ ශෛලබිම්බාරාමය අසල ආරම්භ කරන ලදි.[40] එයට සමගාමී ව 1873 හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් විසින් කොළඹ විද්‍යෝදය පිරිවෙන ද 1875 රත්මලානේ ධම්මාලෝක හිමියන් විසින් විද්‍යාලංකාර පිරිවෙන ද ආරම්භ කරන ලදි. එහි දී ගිහි පැවිදි දෙපක්ෂයට ම මෙහි අධ්‍යාපනය හැදෑරීමට හැකි වූ බැවින් එතෙක් පසුබෑමට ලක් වූ බෞද්ධාගම නැවත පුනර්ජීවනය ඇති වීම නිසා සිංහල සාහිත්‍යයටත් බෞද්ධ සංස්කෘතියටත් නව ජීවයක් ලැබිණි. මෙම කාලයේ මිගෙට්ටුවත්තේ ගුණානන්ද, සුමංගල, සුභූති, පියරතන යන හිමිවරු බෞද්ධාගමේ ගෞරවයත්, අයිතීන් රැක ගැනීම පිණිස ක්‍රිස්තියානි බලයට එරෙහි ව ක්‍රියා කළහ. මෙරට ඇති වූ බෞද්ධ ප්‍රබෝධය යුරෝපයේ ප්‍රචලිත වීමෙන් පසු ඕල්කට්තුමාගේ ආගමනයත් සමග ඉහතින් පෙන්වූ භික්ෂූන් මෙන් ම මිගෙට්ටුවත්තේ ආදි භික්ෂූන්ගේ විශේෂාධාර ඇති ව පරමවිඥානාර්ථ බෞද්ධ සමාගම ආරම්භ කොට ලක්දිව නොයෙක් පාඨශාලාවන් ඇති කිරීමට පූරෝගාමී විය. කළුතර, මාතර, ගාල්ල, මහනුවර ආදි ප්‍රදේශවල පිරිවෙන් අධ්‍යාපනය තව දුරටත් ව්‍යාප්ත වීම සමග ගිහි පැවිදි දෙපක්ෂය අතර ධර්මශාස්ත්‍ර ඥානය බෙදා හැරීමත්, බෞද්ධ සංස්කෘතියේ අභිවෘද්ධිය ඇති වී ජාතික ප්‍රබෝධය උදා විය. විශේෂයෙන් ම 1848 මෙරට නිදහස දිනා ගැනීමට ගිය ගමනේ දී ගිහියන්ට සාපේක්ෂ ව භික්ෂූන් ඉටු කළ කාර්ය භාරය ඉතා වැදගත් වේ. එයින් නො නැවතී පසු කාලීන ශ්‍රී ලංකා දේශපාලන ප්‍රවාහය තුළ භික්ෂුව ඉතා වැදගත් වූ නිසා උන්වහන්සේලාගෙන් තොර ව කටයුතු කිරීමට නො හැකි විය. රට, ජාතිය, ආගම, පිරිහෙද්දී දානයටත්, පංශුකූලයටත් සීමා නොවී ජාතියේ නවෝදය ඇති කිරීමට උන්වහන්සේලා ඉටු කළ මෙහෙවර මෙරට වැසියන් සිහිපත් කරනු ලබන්නේ ගෞරව භක්තියෙනි.

## පාදක සටහන්

1. මහාවංසය, පරිච්ඡේද 2, පිටුව 82
2. රාහුල හිමි, වල්පොළ.: භික්ෂුවගේ උරුමය, ගොඩගේ සහෝදරයෝ, කොළඹ, 1992, පිටු 20
3. Persiwel, R.: An Account of the Island of Ceylon, 1803, p. 201
4. භික්ෂුවගේ උරුමය, පිටුව 63
5. Ribeiro . R.: Historic Tragedy of the Island. Colombo. 1948. p.75.
6. ධම්මදස්සි, ආනමඩුවේ.: ප්‍රබුද්ධ 2, සමයවර්ධන, කොළඹ, 2000, පි 273.
7. Mirando, A. H: Buddhism in Srilanka the $17^{th}$ and $18^{th}$ centuries. Tisara Printers, 1985. p..27.

8. The Historic Traged of the Island in ceylon. p. 75.
9. හික්ෂුවගේ උරුමය, එම පිටුව 64
10. මහාවංසය පරිච්ඡේද 93, 10 - 11 ගාථා.
11. ප්‍රබුද්ධ 2, පිටු 276.
12. හේමසිරි හිමි, පී.: රුහුණු සංඝ සංවිධානය, මාතර බෝධි ආරක්ෂණ සභාව 1990, පිටුව 01
13. හික්ෂුවකගේ උරුමය, පිටුව 65
14. මහින්ද හිමි, යූ.: සම්මුති 1 දීපනී ප්‍රින්ටර්ස්, ගම්පහ, 2000, පිටුව 275
15. Sri Lanka National Archives, p. 22-40
16. හික්ෂුවගේ උරුමය, පිටුව 48
17. සරණංකර සංඝරාජ සමය, පිටුව 58
18. නොක්ස්, රොබට්, පරි, ඩේවිඩ් කරුණාරත්න, එදා හෙළදිව, ගුණසේන සහ සමාගම, 1997, පිටුව 224
19. Goonawardana, K. W.: Dutch Policy in Ceylon, 1990 p. 335
20. මහාවංසය, පරිච්ඡේද 94, 194 ගාථා
21. රුහුණු සංඝ සංවිධානය, පිටු 11.
22. එම. පිටු. 13.
23. Dutch Policy in ceylon, pp. 322 - 352.
24. ඥාණවිමල, කිරිඇල්ලේ.: වෙහැල්ලේ ධම්මදින්න ස්වාමීන්ද්‍ර, ශාසන ඉතිහාසය, කොළඹ 1975, පිටුව 05
25. ප්‍රබුද්ධ 2, පිටුව 291.
26. Perniola V, Rev.: Catholic Church in Sri Lanka, Vol ii, 1742 - 1746 p. 180
27. Dutch Policy in Sri Lanka, p. 334
28. සෙනවිරත්න, අනුරාධ.: කන්ද උඩරට මහනුවර, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ, 1989, 34, 35 පිටු
29. එම, පිටුව 36
30. වාචිස්සර හිමි, කොටගම.: සරණංකර සංඝරාජ සමය, ගොඩගේ සහෝදරයෝ, කොළඹ, 1964, පිටු 20-25
31. හික්ෂුවගේ උරුමය, පිටු 74
32. සෙනවිරත්න, වී. වී.: ලංකා ඉතිහාසයේ බ්‍රිතාන්‍ය යුගය, කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රකාශනයකකි, 1999 පිටුව 212
33. එම. පිටුව. 219
34. Coomarawamy, Mediaeval Sinhalese Art 1981, p. 45
35. Mills. L. A.: Ceylon Under British Rule, pp. 124-125
36. Perera, S. G.: A History of celon policy vól ii. colombo. 1943, p. 180.
37. Perera, S.J.: A Histiory of Ceylon for School, Vol. II 1943. p. 144
38. Silva, K.M.: Social Policy Missionary Organization in Ceylon, 1976, p. 109
39. හික්ෂුවගේ උරුමය, 109 පිටුව
40. කල්‍යාණි ශාසනවංශය, පිටුව 129